දුරකථන
தொலைபேசி
Telephone
2698475,
2698490,
2698507

ෆැක්ස්
பெக்ஸ்
Fax
2692913,
2693869

විද්‍යුත් තැපැල
மின்னஞ்சல் முகவரி
e-mail
postmaster@health.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
website
www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය
எனது இல
My No.
CF/EXE/01/2025

ඔබේ අංකය
உமது இல
Your No. :

දිනය
திகதி
Date
2025/06/27

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
**Ministry of Health & Mass Media**

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02-109/2025**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ
අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර
අධ්‍යක්ෂ - ජාතික රෝහල, ගාල්ල
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානින් වෙත.

**ඖෂධවේදි II ශ්‍රේණියේ / II "අ" ඛණ්ඩය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025**

ඖෂධවේදි II වන ශ්‍රේණියේ / II "අ" ඛණ්ඩය නිලධාරීන් සඳහා අනුමත වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය **2025.08.23** හා **2025.08.24** දෙදින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. **(විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.)** විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ඖෂධවේදි තනතුරේ II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට පත්වීම් ලද හා මෙතෙක් විභාගය සම්පූර්ණකර නොමැති නිලධාරීන්ට පමණි.

**සැ.යු :-2025.07.18 දින වන විට II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියට පත් කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න. (II ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)**

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, වෙත **2025.07.18** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි **"ඖෂධවේදි II වන ශ්‍රේණියේ / II "අ" ඛණ්ඩය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00ක් වටිනා මුද්දර ඇලවූ 9×4 ප්‍රමාණයේ ලියුම් කවර 02ක් ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**04.** විභාග ගාස්තු

I. විභාගයට පළමුවරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 /- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**05.** විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය හෝ ඊට අදාල ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06.** විභාග පරිපාටිය

මෙම විභාගය කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය ලිඛිත, ප්‍රායෝගික හා වාචික වශයෙන් කොටස් තුනකින් සමන්විත වන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ලෙස විෂයන් දෙකකින් යුක්ත වන අතර එක් එක් විෂය සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය.

එක් වරකදී හෝ කිහිපවාරයකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමු වරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියළුම විෂයන් අයදුම් කළ යුතුය.

**07.** විභාග නිර්දේශ මාලාව

**07.1** දෙපාර්තමේන්තු පරීක්ෂණය

**07.1.1** විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රය

**මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 03 කි. රචනා මාදිලියේ ප්‍රශ්න 08 කින් සමන්විතය. ඉන් ඕනෑම ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි.**

**විෂය නිර්දේශය**

i. භිෂග් කර්මය

ii. අධිකරණ භිෂග් කර්මය (විෂ වර්ග, අබිං හා අන්තරාදායක ඖෂධ වර්ග ගණනය)

iii. ඖෂධවේදය

iv. වාර්ෂික ඇස්තමේන්තු හා ඖෂධ වර්ග, සැරහුම් ශල්‍ය උපකරණ හා වෛද්‍ය වායු වර්ග යනාදිය ඉල්ලුම් කිරීම.

v. ඖෂධ වර්ග හා ශල්‍ය උපකරණ ප්‍රාදේශිය වශයෙන් මිළදී ගැනීම හා එහි කාර්ය පටිපාටිය

vi. දින නියමිත නිෂ්පාදන අතිරික්තයන් , කාලය ඉකුත් වූ සංසරණය නොවන ඖෂධ වර්ග සැරහුම් හා ශල්‍ය උපකරණ ඉවත්කර ගැනීමේ ක්‍රියාපිළිවෙළ, තත්ත්වයෙන් බාල නිසා ඉවත් කරන ලද ඖෂධ සහ හිස් ඇසුරුම් හා භාජන අපහරණය කිරීමේ ක්‍රියාපිළිවෙළ

vii. ඖෂධ වර්ග, සැරහුම් හා ශල්‍ය උපකරණ ආදිය ලබාගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම සඳහා වන කාර්ය පරිපාටිය

viii. ප්‍රායෝජනයට ගත නොහැකි වූ හා දූෂණය වූ ඖෂධ වර්ග හා ශල්‍ය උපකරණ යනාදිය ඉවත් කිරීමේ ක්‍රියාපිළිවෙල.

**07.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය**

(මෙම පරීක්ෂණය සංවිධිත ව්‍යුහගත ප්‍රායෝගික පරීක්ෂණයකි. (Orgnaized Structured Practical Examination (O.S.P.E.)) (කාලය පරීක්ෂණය අනුව තිරණය වේ)

රෝහල්වල සහ ඔසුසල්හි රෝගීන් සඳහා භාවිතා කරනු ලබන විලවුන්, උපකරණ හා ඖෂධීය නිෂ්පාදන පිළිබඳ වෘත්තිය දැනුම ලබාදෙන ලද සාම්පල/ආදර්ශයන් අනුසාරයෙන් ප්‍රායෝගිකව ඇගයීමකට ලක් කරනු ලැබේ. ඖෂධ නියම කිරීමේ තුන්ඩු හා ඇඳ ඉහපත් වාර්තා ආදර්ශයන් සපයා ඒවාට අදාල විෂය කරුණු පිළිබඳව ප්‍රායෝගික දැනුම පරික්ෂා කරනු ලැබේ. මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී ආධාරක ලෙස නිල සම්මත ග්‍රන්ථ අදාල වන පරිදි පරිශීලනය කිරීමට අවසර දෙනු ලැබේ. (BP/ BNF/ Hospital formulary etc.)

**07.1.3 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය**

විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාල විෂය නිර්දේශය වාචික හා ප්‍රායෝගික පරීක්ෂණ වලට අදාලවේ. (කාලය විනාඩි 15 යි)

**07. 2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07. 2.1 ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය**

කාලය පැය 02 ක රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න 07 කින් 04 කට පිළිතුරු සැපයිය යුතු අතර මුළු ලකුණු 100කි. සමත්වීම සඳහා අවම ලකුණු 40ක් ලබා ගත යුතුය.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ජේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| පරිච්ජේද :- XV | - | අධ්‍යයන අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම |
| XVI | - | නිවාඩු ගමන් |
| XXIII | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි. |
| XXIV | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV | - | වෘත්තිය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ |
| XXVII | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII | - | පරිපාලන කාර්ය පටිපාටි සහ විධි |
| XXX | - | රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII | - | නිති උපදෙස් හා නිති ක්‍රියාමාර්ග |
| XLVII | - | සාමාන්‍ය හැසිරීම හා විනය |
| XLVIII | - | විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති |

07.2.2 – මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

කාලය පැය 02 කි. රචනා ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි. සමත් වීම සඳහා අවම ලකුණු මට්ටම 40 කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

(01) VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය. අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව හා බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට මු.රෙ. 396 දක්වා)

(02) XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා :- සැපයීම්/මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවීම (මු.රෙ. 708 සිට මු.රෙ. 775 දක්වා)

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම.**

අපේක්ෂකයන් විසින් වෙනත් අපේක්ෂකයකුගේ පිළිතුරු පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින් හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින් හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබා ගැනීමෙන්ද වැලකී සිටිය යුතුය. ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ භාවිතයෙන්ද වැළකිය යුතුය. මෙම නීති කඩකරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

**Web Path :- www.health.gov.lk → Staff Access → Administration → Examination → Circulars**

**සැ.යු - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

යු.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

යු. ඒ. එස්. එච්. සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

EXE - P

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

ආදර්ශ අයදුම්පත

ඖෂධවේදී II ශ්‍රේණියේ / II "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025

01. (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( සිංහලෙන් )

.............................................................................................................

.............................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) : .............................................................................

.............................................................................................................

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) II ශ්‍රේණියට / II "අ" ඛණ්ඩයට උසස් කල දිනය ..................................................

(ii) II ශ්‍රේණියට / II "අ" ඛණ්ඩයට උසස් කල ලිපි අංකය ...............................................

(II ශ්‍රේණියට උසස් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ අමුණන්න.)

(iii) ඔබට එරෙහිව විනය කටයුතු පවතිද : ඇත ☐ / නැත ☐

(අදාළ කොටුව තුළ (√) ලකුණ යොදන්න.)

විනය නියෝග පවති නම් : යොමු අංකය ☐ දිනය ☐

(iv) දැනට ලබන වාර්ෂික වැටුප .....................................................................

(v) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

(vi) ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(vii) විද්‍යුත් ලිපිනය ..................................................................................

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටිමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (×) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය ☐ මුදල් රෙගුලාසි ☐ විෂයානුබද්ධ ලිඛිත ☐

විෂයානුබද්ධ ප්‍රායෝගික ☐ විෂයානුබද්ධ වාචික ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්).................................................................

(ඉංග්‍රීසියෙන්).............................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛිය අමාත්‍යාංශයට - ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත ..........................................................................

(ඈ) සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය.........................................................................

(ඉ) විභාග ප්‍රවේශපත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 110.00ක මුද්දර ඇලවූ ලියුම් කවර 02 ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................................................

(ඊ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ............................................................................

.............................................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ...........................................................

.............................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ) - ....................................................

05. (අ) මීට පූර්ම මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?....................

| |
|---|
| මුද්දර කොටුව |

06. අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, *මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු............. ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකගවන බවත් සහතික කරමි.

දිනය ...................... ..........................................

අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු විෂය භාර නිලධාරියාගේ/නිලධාරිනියගේ සහතිකය**

මෙම අයදුම්පත ***අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර/ පසු මා වෙත භාරදුන් බවත්**, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව *අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති/ නැති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ....................... ..........................................................................

නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

...........................................................මහතා/මහත්මිය/මෙනවිය .................................. නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, *** III ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී ඇති/ නැති බවත්, අයදුම්කරුට එරෙහිව විනයානුකුල කටයුතු** පවතින / නොපවතින බවත් *** II ශ්‍රේණියට පත් කිරීමට අදාල නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති, II ශ්‍රේණියට උසස් වීමට හා විභාගයට පෙනී සිටීමට** සුදුසුකම් ලබා ඇති/ නැති බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත් අදාල රු.......ක් වටිනා මුද්දර අලවා ඇති බවත්/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවද, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, සහතික කරමි.

දිනය ....................... ..........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(රබර් මුද්‍රාව තැබිය යුතුයි)

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..........................................................................................මහතා/මහත්මිය/මෙනවිය....................................වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ........................ ..........................................

විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන(රබර් මුද්‍රාව තැබිය යුතුය)

*(අනවශ්‍ය කොටස් කපා හරින්න)